# දැන්වීමයි

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

### යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම

### විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2017/2018 අධ්‍යයන වර්ෂය

### දෘශ්‍ය කලාවේදී /ප්‍රාසංගික කලාවේදී (සංගීත/නර්තන/නාට්‍ය හා රංගකලාව)

### විශේෂ උපාධි පාඨමාලා

(2017 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත)

2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමට 2017 වර්ෂයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයින්ගෙන්, යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය, අධ්‍යයන වර්ෂය 2017/2018 (අ.පො.ස. (උසස් පෙළ) විභාගය 2017)" ශිෂ්‍ය අත්පොතේ 1 කොටසේ 1.2 ජේදය යටතේ ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් සපුරා ඇති

**සහ**

චිත්‍ර හා මූර්ති කලා / සංගීතය / නර්තනය / නාට්‍ය හා රංග කලාව යන විෂයයන් ගෙන් හැදෑරීමට බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවට අදාළ විෂයට 2017 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ්‍යයක් සහිතව පෙනීසිටි විෂයයන් තුනෙන්ම සමත්ව සිටීම

(ii) ප්‍රවේශය සඳහා අවශ්‍ය ඉහත කී අවම සුදුසුකම් සපුරා ඇති සිසුන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ප්‍රවේශය ලැබීම සඳහා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන **යෝග්‍යතා පරීක්ෂණයෙන්** සමත්විය යුතුය.

/ ... 02

**2.සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන එක් එක් පාඨමාලාවට අදාළ තොරතුරු පහත දක්වා ඇත.**

**2.1. නර්තන - ප්‍රාසංගික කලාවේදී (විශේෂ)**
උඩරට නර්තනය
පහතරට නර්තනය
සබරගමු නර්තනය
අනුෂාංගික කලා
ශ්‍රී ලාංකේය බෙරවාදනය
කථක් නර්තනය
භරත නාට්‍යම්
වීඩියෝ නර්තන රචනය
සන්නිවේදන සහ ජනශ්‍රැති අධ්‍යයනය
ඩිජිටල් සිනමා

**2.2 නාට්‍ය හා රංගකලා – ප්‍රාසංගික කලාවේදී (විශේෂ)**
රූපණය
නාට්‍ය රචනය හා අධ්‍යක්‍ෂණය
මුද්‍රානාට්‍ය හා නව නර්තනය

**2.3 සංගීත – ප්‍රාසාංගික කලාවේදී (විශේෂ)**
උත්තර භාරතීය සංගීතය
මානවවංශ සංගීත විද්‍යාව
බටහිර සංගීතය
ව්‍යවහාරික සංගීත සහ ජනසන්නිවේදනය
දක්ෂිණ භාරතීය සංගීතය
සංගීත විද්‍යාව

**2.4 දෘශ්‍ය කලා – දෘශ්‍ය කලාවේදී (විශේෂ)**
චිත්‍ර කලා
මූර්ති කලා
මුද්‍රණ කලා
දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ සැලසුම්කලා
බහුශික්ෂණාත්මක නිර්මාණ සැලසුම්කලා
සෙරමික් මූර්ති, සෙරමික් කලා, සෙරමික් සැලසුම්
බහුමාධ්‍ය කලා
රෙදිපිළි හා ඇඟළුම් කලා
ඉතිහාසය හා කලා සිද්ධාන්ත

03. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවිය වන www.vpa.ac.lk මගින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා වන අයදුම්පත ලබාගත හැක.

/...03

04. පාසල් අයදුම්කරුවන් විදුහල්පති විසින් ද, බාහිර අයදුම්කරුවන් විහාරාධිපතිවහන්සේ කෙනෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් ද, අයදුම්පතේ අංක 09 හා 10 යටතේ සඳහන් කර ඇති ප්‍රතිඵල සහතික කර තිබීම අත්‍යාවශ්‍ය වේ.

05. යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවෙකුගෙන් එක් විෂයක් සඳහා රු. 2,500/- ක ගාස්තුවක් අය කරනු ලැබේ. එම මුදල දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ලබා ගත හැකි වවුචර්පත් මගින්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමින් ලංකා බැංකුව නිදහස් චතුරශ්‍ර ශාඛාවේ ඇති අංක **5276145** දරණ ගිණුමට බැර වන පරිදි ගෙවිය යුතුය.

06. අ.පො.ස.(උ.පෙළ) සෞන්දර්ය විෂයන් දෙකක් සඳහා පෙනී සිට එම විෂයන් දෙකෙන්ම යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට බලාපොරොත්තුවන අපේක්ෂකයින් වෙන වෙනම එම විෂයන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු ගෙවීම සහ අයදුම්පත් දෙකක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. අයදුම්පත සමග ඔබගේ නම හා ලිපිනය ලියන ලද අගල් 9 × 4 ප්‍රමාණයේ රු. 50/- ක මුද්දර ගැසූ ලිපි කවරයක් සහ බැංකුවට මුදල් ගෙවන ලද වවුචරයේ මුල් පිටපත ද අමුණා එවිය යුතුය. <u>වෙනත් කිසිදු ලියවිල්ලක් අයදුම්පතට අමුණා එවීම අවශ්‍ය නොවන අතර මුදල් ගෙවන ලද වවුචරයේ ජායා පිටපත් ද භාරගනු නොලැබේ.</u>

08. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.02.01 හෝ එදිනට පෙර සහකාර ලේඛකාධිකාරී/ අධ්‍යයන හා ශිෂ්‍යසේවා, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, නො.21, ඇල්බට් වන්ද්‍රවංකය, කොළඹ 07 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. ලියුම් කවරයේ ඉහල වම් කෙළවර " **සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය – අධ්‍යයන වර්ෂය 2017/2018**" ලෙස හා "**අයදුම්කරන පාඨමාලාව**" ද සඳහන් කළ යුතුය.

09. විශ්වවිද්‍යාල ප්‍රවේශයට අවශ්‍ය **<u>අවම සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් හෝ නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u> එවැනි අවස්ථාවක දී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

10. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින සියලුම සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම් කර තිබිය යුතුය.

11. මෙම යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනයන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත යථාකාලයේදී පෞද්ගලිකවම දන්වනු ලබන අතර මෙම යෝග්‍යතා පරීක්ෂණය සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

වැ.බ. ලේඛකාධිකාරී,<br>
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,<br>
21, ඇල්බට් වන්ද්‍රවංකය,<br>
කොළඹ 07<br>
දු.ක.අ. – 011 2033710

2018.01.08